# ඇබෑර්තු

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) - අදියර II

## (ව්‍යාපෘති කාලය - 2026 - 2031)

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 සහ රජයේ බඳවා ගැනීම් පටිපාටින්ට අනුකූලව පහත තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනම" මත ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩල බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහ කැපවීම සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම වැඩසටහනේ මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 536.5 ක් වන අතර, එය දේශීය මූලාශ්‍රවල දායකත්වයෙන් සමන්විත වේ.

තනතුරු සඳහා අදාළ වන වැටුප 2019.03.15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 හි 03 වගුවෙහි 05 කොළමේ සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි සඳහන් පරිදි වේ.

**ඇබෑර්තු විස්තර**

| අංකය | විස්තරය/ රැකියා ස්ථානය | වැටුප් තලය | තනතුරු ගණන |
|---|---|---|---|
| 01 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - කොළඹ | PS01-PS06 සහ සහායක කාර්ය මණ්ඩලය | 71 |
| 02 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මඩාටුගම | | 37 |
| 03 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මොරගහකන්ද | | 38 |

**අදාළ චක්‍රලේඛ**

- PS01-PS06 වැටුප් තලය සඳහා MSD චක්‍රලේඛ අංක 01/2019
- සහය කාර්යය මණ්ඩලය (මෙම තනතුරු රජයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව සිදු කෙරේ.) සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 සහ MSD චක්‍රලේඛ අංක 1/2019 සියලු අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ප්‍රවීණතාවය මෙන්ම රාජ්‍ය රෙගුලාසි සහ පරිගණක සාක්ෂරතාව පිළිබඳ නිපුණතාවය අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකාව තුළ විදේශ ආධාර ලබන ව්‍යාපෘතීන්හි වැඩ පළපුරුද්ද අමතර වාසියකි.

ඉහත තනතුරු සඳහා අයදුම් කරනු ලබන දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

වැඩිදුර තොරතුරු සඳහා **www.irrigationmin.gov.lk** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

(ඉහත සඳහන් චක්‍රලේඛ අංක 01/2019 පරිශීලනය සඳහා මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියට පිවිසෙන්න.)

එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම 2026.02.05 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**අතිරේක ලේකම් (PPM ඒකකය),**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,**
**10 වන මහල, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,**
**අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.**

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවේ. මොනයම් ආකාරයක හෝ කිසිදු ආකාරයක බලපෑමක් සිදුකිරීම නුසුදුසුකමක් වන අතර එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**